14249

AL/2024/28/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ගෘහ ආර්ථික විද්‍යාව I
மனைப் பொருளியல் I
Home Economics I

28 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. වර්ණ සංකලනය හා බැඳි නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) වර්ණයකට කළු මිශ්‍ර කිරීමෙන් වටිනාකම වැඩි වේ.
(2) වර්ණයක තද බව හෝ ලා බව තීව්‍රතාව වේ.
(3) වර්ණයකට සුදු මිශ්‍ර කිරීමෙන් වටිනාකම අඩු වේ.
(4) කොළ වර්ණයට රතු මිශ්‍ර කිරීමෙන් වටිනාකම වැඩි වේ.
(5) වර්ණයක දීප්තිමත් බව හෝ අඳුරු බව තීව්‍රතාව වේ.

2. නූතනත්වයට අනුව ගොඩනැගිලි නිර්මාණයේ දී දැකිය හැකි ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) ගොඩනැගිලි සංකීර්ණ බවකින් යුක්ත වීම
(2) කැටයම් යොදා නිර්මාණය කර තිබීම
(3) විවිධ වර්ණ සංකලනවලින් යුක්ත වීම
(4) ජ්‍යාමිතික හැඩතලවලට ගොඩනැගී තිබීම
(5) නිර්මාණය සඳහා අධික පිරිවැයක් දරා තිබීම

3. අභ්‍යන්තර අවකාශ නිර්මාණයේ දී යොදාගන්නා උපාංගයක් **නොවන්නේ** පහත ඒවායින් කවරක් ද?
(1) පොකුණු
(2) අභ්‍යන්තර ශාක
(3) ගෘහීය උපකරණ
(4) දිය ඇලි
(5) මැද මිදුල

4. පහත ප්‍රකාශ සලකන්න.
A – වහලයකට සූර්ය පැනල සවිකිරීමෙන් විදුලිය භාවිතය අවම කරගත හැකි ය.
B – ජාතික කෞතුකාගාරය නිර්මාණය වී ඇත්තේ යුරෝපීය සම්ප්‍රදායට ය.
C – ජර්මනියේ බව්හවුස් නිර්මාණය වී ඇත්තේ පෞරාණික සම්ප්‍රදායට ය.
D – ලිබර්ටි ප්ලාසා ගොඩනැගිල්ල නිර්මාණය වී ඇත්තේ පශ්චාත් නූතන සම්ප්‍රදායට ය.

මේවා අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,
(1) A පමණි.
(2) C පමණි.
(3) A සහ B පමණි.
(4) B සහ D පමණි.
(5) A, B, C සහ D යන සියල්ල ම ය.

5. පොලිසැකරයිඩ දෙකක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ඇමයිලෝස් සහ මෝල්ටෝස්
(2) ඇමයිලෝස් සහ සුක්‍රෝස්
(3) ග්ලයිකොජන් සහ ඇමයිලෝස්
(4) ග්ලයිකොජන් සහ ගැලැක්ටෝස්
(5) සෙලියුලෝස් සහ ග්ලූකෝස්

[දෙවැනි පිටුව බලන්න

6. ප්‍රෝටීන පරිපූරණය නිරූපණය වන ආහාර යුගලය කුමක් ද?

(1) මුං කිරිබත් සහ ඉඩ්ලි
(2) ඉඹුල් කිරිබත් සහ තෝසේ
(3) පැණි ආප්ප සහ ඉඩ්ලි
(4) ඉඹුල් කිරිබත් සහ මුං කිරිබත්
(5) පැණි ආප්ප සහ තෝසේ

7. ප්‍රෝටීනවල කාර්යයන් පිළිබඳව **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) කොලැජන් ශරීරය සෘජුව පවත්වා ගැනීමට වැදගත් වන ප්‍රෝටීනයකි.
(2) සියලුම එන්සයිම‌වල ප්‍රෝටීන අන්තර්ගත වේ.
(3) හිමොග්ලොබින් ප්‍රෝටීන අන්තර්ගත ව්‍යුහයකි.
(4) ප්‍රතිදේහ ප්‍රෝටීනමය සම්භවයක් සහිත ය.
(5) හෝමෝන සියල්ලේම මූලික තැනුම් ඒකකය ප්‍රෝටීන වේ.

8. විටමින් පිළිබඳව සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) විටමින් C පිළිකා ඇතිවීමේ අවදානම අඩු කරයි.
(2) විටමින් E ආහාරවල අඩංගු යකඩ අවශෝෂණය කිරීමට උපකාරී වේ.
(3) විටමින් D ඌනතාව ප්‍රාග් පරිණත දරු උපත්වලට හේතු වේ.
(4) විටමින් B_9 ලබාගත හැක්කේ සත්ත්ව ආහාර පරිභෝජනය මගින් පමණි.
(5) විටමින් K ප්‍රතිඔක්සිකාරකයක් ලෙස වැදගත් වේ.

9. ආහාරමය තන්තු බහුල වශයෙන් අඩංගු ආහාර යුගලය තෝරන්න.

(1) ආටා පිටි සහ අර්තාපල්
(2) පේර සහ කොහිල
(3) තක්කාලි සහ ආටා පිටි
(4) අර්තාපල් සහ කොහිල
(5) පේර සහ තක්කාලි

10. ආහාර ජීර්ණය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) මහා අන්ත්‍රය, ශූන්‍යාන්ත්‍රය සහ ශේෂාන්ත්‍රයෙන් යුක්ත වේ.
(2) ක්ෂුද්‍රාන්ත්‍රය තුළ දී ප්‍රධාන වශයෙන් ජලය අවශෝෂණය වේ.
(3) මහා අන්ත්‍රය තුළ ආම්ලික මාධ්‍යයක් පවතී.
(4) ආමාශයික යුෂයේ පෙප්සින් සහ ට්‍රිප්සින් අඩංගු වේ.
(5) ආහාර ජීර්ණය සංවෘත්තීය ක්‍රියාවලියකි.

11. පහත ප්‍රකාශ සලකන්න.

A – ප්‍රතිජීවක ඖෂධ නිතර භාවිත කිරීමෙන් ආහාර මාර්ගය තුළ විටමින් නිෂ්පාදනයට බාධා වේ.
B – මත්පැන් පානය නිසා ජලද්‍රාව්‍ය විටමින් අවශෝෂණය අඩු වේ.
C – මානසික ආතතිය නිසා ඛනිජ අවශෝෂණය අඩු වේ.

මේවා අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

(1) A පමණි.
(2) A සහ B පමණි.
(3) A සහ C පමණි.
(4) B සහ C පමණි.
(5) A, B සහ C යන සියල්ල ම ය.

12. පෝෂකය සහ එහි ඌනතා ලක්ෂණය නිවැරදිව ගළපා ඇති වරණය තෝරන්න.

(1) යකඩ – ආහාර අරුචිය
(2) අයඩින් – ප්‍රතිශක්තිය අඩුවීම
(3) ෆෝලික් අම්ලය – තුවාල සුවවීම ප්‍රමාදවීම
(4) සින්ක් – බුද්ධි වර්ධනයට බාධාවීම
(5) මැග්නීසියම් – අස්ථි දුර්වලවීම

13. අධිපෝෂණය හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A – මෙය දුෂ්පෝෂණ ආකාරයකි.

B – ඉහළ කැලරි ප්‍රමාණයක් සහ අඩු පෝෂණයක් සහිත ආහාර ගැනීම මෙයට හේතු වේ.

C – මෙහි දී අතිරික්ත ශක්තිය මේදය ලෙස සිරුරේ තැන්පත් වේ.

D – මෙම තත්ත්වයේ දී ශරීර ස්කන්ධ දර්ශකයෙහි (BMI) අගය 30ට වඩා වැඩි වේ.

මේවා අතුරෙන් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A, B සහ C පමණි. (2) A, B සහ D පමණි.
(3) A, C සහ D පමණි. (4) B, C සහ D පමණි.
(5) A, B, C සහ D යන සියල්ල ම ය.

14. පහත සඳහන් රෝග/තත්ත්ව සලකන්න.

A – අධි රුධිර පීඩනය

B – හෘදයාබාධ

C – පිළිකා

D – මානසික ආතතිය

මේවා අතුරෙන්, ඉණ : උකුල වට ප්‍රමාණය අතර අනුපාතය 0.9 ට වඩා වැඩි පිරිමි පුද්ගලයෙකු හට ඇතිවිය හැකි රෝග/තත්ත්ව වනුයේ,

(1) A සහ B පමණි. (2) B සහ C පමණි.
(3) A, B සහ C පමණි. (4) A, B සහ D පමණි.
(5) A, B, C සහ D යන සියල්ල ම ය.

15. විටමින් A ඌනතා ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

(1) මතක තබා ගැනීමේ හැකියාව අඩුවීම (2) ශ්වසන පද්ධතියේ ආසාදන අවදානම වැඩිවීම
(3) ඉක්මනින් වෙහෙසට පත්වීම (4) මානසික උදාසීන බව ඇතිවීම
(5) සිරුර සුදුමැලි ස්වභාවයක් ගැනීම

16. බෝ නොවන රෝගය සහ එය පාලනයට සුදුසු පෝෂණ උපදෙස නිවැරදිව ඇතුළත් වරණය තෝරන්න.

(1) ආමාශයික ප්‍රදාහය – දිනකට ආහාරවේල් 3ක් ගැනීමට පුරුදුවීම
(2) හෘදයාබාධ – රතු මස් වර්ග දිනපතා ආහාරයට එක්කර ගැනීම
(3) මලබද්ධය – කුළුබඩු අධිකව යෙදූ ආහාර පාලනය කිරීම
(4) අධි රුධිර පීඩනය – පොටෑසියම් බහුල ආහාර වැඩිපුර ගැනීම
(5) ආඝාතය – නැවුම් කිරි පානය කිරීම

17. ආහාර සැකසීමේ ක්‍රියාවලියේ දී භාවිත කරන ආකලන දෙකක් වන ඒමයිල් ඇසිටේට් සහ ප්‍රොපිලීන් පිළිවෙළින්

(1) රසකාරකයක් සහ තෙලෝදකාරකයකි.
(2) සුවඳකාරකයක් සහ පදම්කාරකයකි.
(3) පදම්කාරකයක් සහ මෘදුකාරකයකි.
(4) සුවඳකාරකයක් සහ තෙලෝදකාරකයකි.
(5) මෘදුකාරකයක් සහ රසකාරකයකි.

18. පහත ප්‍රකාශ සලකන්න.

A – ආහාරය අඩු දියර ප්‍රමාණයක පිසගනියි.

B – 100°C උෂ්ණත්වයක දී පිසීම සිදු වේ.

C – පිසීම සඳහා වැඩි කාලයක් යොදාගනී.

D – පිසීමේ දී තාපය සංක්‍රාමණය වනුයේ සන්නයනය හා සංවහනය මගිනි.

මේවායින් ස්ටූ කිරීම හා සම්බන්ධ ප්‍රකාශ වනුයේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ D පමණි.
(4) A, C සහ D පමණි. (5) B, C සහ D පමණි.

[හතරවැනි පිටුව බලන්න

19. ෂූ පේස්ට්‍රිය සෑදීමේ දී අනුගමනය කරන පියවර වනුයේ,
(1) පිටි සහ මේදය මිශ්‍රකර පසුව බිත්තර එකතු කිරීමයි.
(2) මේදය රත්කර බිත්තර මිශ්‍ර කර පසුව පිටි එකතු කිරීමයි.
(3) බිත්තර ගසා මේදය මිශ්‍ර කර පසුව පිටි එකතු කිරීමයි.
(4) බිත්තර සමග මේදය මිශ්‍ර කර පසුව පිටි එකතු කිරීමයි.
(5) මේදය රත්කර පිටි මිශ්‍ර කර පසුව බිත්තර එකතු කිරීමයි.

20. ආහාර විෂවීමට හේතුවන බැක්ටීරියා විශේෂය කුමක් ද?
(1) ක්ලොස්ට්‍රිඩියම් බොටියුලිනම් (*Clostridium botulinum*)
(2) සැල්මොනෙල්ලා ටයිෆෝසා (*Salmonella typhosa*)
(3) විබ්‍රියෝ කොලරා (*Vibrio cholera*)
(4) හෙලිකොබැක්ටර් පයිලෝරා (*Helicobacter pylora*)
(5) එස්චෙරිෂියා කෝලයි (*Escherichia coli*)

21. ආහාර පරිරක්ෂණය හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.
A – පැස්ටරීකෘත ආහාර 10°C ට වඩා අඩු උෂ්ණත්වයක ගබඩා කළ යුතු ය.
B – කඩිනම් අධිශීතනයේ දී ආහාරය තුළ අයිස්කැට ඇති වේ.
C – ඇසුරුම් කළ ආහාර සඳහා ප්‍රවිකිරණය යොදාගත හැකි ය.
D – විසිර වියලනය, ද්‍රවමය ආහාර වියළීමේ දී පමණක් භාවිත වේ.
මෙයින් නිවැරදි වන්නේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ D පමණි.
(4) A, C සහ D පමණි. (5) B, C සහ D පමණි.

22. නයිට්‍රයිට හා නයිට්‍රේට භාවිත කරමින් පරිරක්ෂණය කරන ආහාර වර්ග වනුයේ,
(1) ජෑම් සහ වියලන ලද එළවළු ය.
(2) චීස් සහ මස් නිෂ්පාදනයන් ය.
(3) ජෑම් සහ පලතුරු පල්ප ය.
(4) චීස් සහ වියලන ලද එළවළු ය.
(5) පලතුරු පල්ප සහ මස් නිෂ්පාදනයන් ය.

23. වාණිජ මැහුම් වර්ගීකරණයට අනුව අගුලු මැස්ම වර්ග කර ඇති මැහුම් වර්ගය කුමක් ද?
(1) 100 (2) 200 (3) 300 (4) 400 (5) 500

24. වාණිජ මැහුම් ක්‍රමවලට අදාළ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) ලේස්, ඉලාස්ටික් සහ රිබන් ඇල්ලීමට නොපෙනෙන මැස්ම යොදා ගනියි.
(2) අක්වක් අගුලු මැස්මේ දී රෙද්දේ දෙපැත්තම එකම ආකාරයට දිස් වේ.
(3) අත් මැස්ම රෙදි දෙපොටක් සම්බන්ධ කරගැනීමට යොදා ගනියි.
(4) අද්දර නිමාව සහිත දම්වැල් මැස්ම අයත් වන්නේ 600 මැහුම් වර්ගයට ය.
(5) අගුලු මැස්ම, ඉඳිකටුවේ නූල සහ ඉද්දේ නූල යන නූල් දෙපොටින් සමන්විත ය.

25. කැපොක්, වීදුරු සහ ඇරමිඩ් යන කෙඳි අයත් වනුයේ පිළිවෙළින් කුමන කෙඳි වර්ගවලට ද?
(1) ශාකමය, ඛනිජමය සහ විශේෂිත
(2) පුනර්ජනිත, විශේෂිත සහ කෘත්‍රිම
(3) ශාකමය, පුනර්ජනිත සහ ඛනිජමය
(4) ශාකමය, විශේෂිත සහ පුනර්ජනිත
(5) ඛනිජමය, කෘත්‍රිම සහ විශේෂිත

26. වියමන් වර්ග දෙකක රූප සටහන් පහත දැක්වේ.



A



B

A සහ B යනු පිළිවෙළින්,

(1) ජටා වියමන සහ සැටින් වියමනයි.
(2) සරල හීරි වියමන සහ හරස්දාර වියමනයි.
(3) සැටින් වියමන සහ චාම් වියමනයි.
(4) සරල හීරි වියමන සහ ජටා වියමනයි.
(5) සැටින් වියමන සහ හරස්දාර වියමනයි.

27. රෙදිපිළිවලට දෙනු ලබන නිමාවන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ඇලුමිනියම් ආලේපයක් යෙදීමෙන් බැක්ටීරියානාශක නිමාව ලබා දේ.
(2) සැන්ෆරීකරණයට භාජනය කළ හැකි වන්නේ කපු රෙදි පමණි.
(3) රෙද්දක් ගිනිදැල්ලක් මතින් ගමන් කරවීමෙන් පිටතට නෙරා ඇති කෙඳි පිළිස්සේ.
(4) එන්සයිමවල බහා පසුව සේදීමෙන් රෙද්දට රළු බවක් ගෙන දේ.
(5) සුවපහසු නිමාව, රෙද්දට ඇඳෙන සුළු හා දිලිසෙන බවක් ගෙන දේ.

28. පහත දක්වා ඇති ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) සෘජු අද්දරක් නිම කිරීම සඳහා විකර්ණාකාර පටියක් යෙදිය හැකි ය.
(2) කැඳහරණයේ දී අම්ල හෝ එන්සයිම ජලයට එක් කරයි.
(3) සැටින් වියමන සහිත රෙදි මෘදු බවින් හා සුමට බවින් යුක්ත ය.
(4) තද වර්ණ සහිත කපු ඇඳුම්වල වර්ණයේ තද බව අඩු කිරීමට හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් භාවිත කරයි.
(5) හිරුඑළියට ලක් කිරීම නිසා පොලිඑස්ටර් රෙදි ඉක්මනින් දිරාපත් වේ.

29. කෙටි සාය මැසීමේ දී පළමුව මැසිය යුතු වන්නේ,

(1) අංශ මුට්ටුව ය. (2) ඉණ ආර ය. (3) ඉදිරිපස ඉණ ය.
(4) සැනගාංචුව ය. (5) පිටුපස මැද මුට්ටුව ය.

30. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් මතුපිට මෝස්තර ගැන්වීමේ ක්‍රම පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) රෙදි මුද්‍රණයේ දී සම්පූර්ණ රෙද්දම සායම් තුළ ගිල්වයි.
(2) රෝලර් මුද්‍රණයේ දී වර්ණ කිහිපයක් යෙදීමට එකම රෝලරය භාවිත කළ හැකි ය.
(3) මුද්‍රිත රෙද්දක ඇති මෝස්තරයක් වටා මැසීම ඇප්ලික් කිරීම වේ.
(4) සිදුරු තහඩු (ස්ටෙන්සිල්) මුද්‍රණයේ දී රෙද්ද මත සිදුරු තහඩුව තබා එය තුළින් රෙද්දට වර්ණ පතිත වීමට සලස්වයි.
(5) සෙලියුලෝස්, ප්‍රෝටීන් සහ කෘත්‍රිම රෙදි සඳහා එකම සායම් වර්ගය භාවිත කළ හැකි ය.

31. සන්නිවේදනය හා සම්බන්ධ **සාවද්‍ය** වැකිය තෝරන්න.

(1) අවාචික සන්නිවේදනයේ දී විවිධ අදහස් ප්‍රකාශ කිරීමට සංඥා යොදා ගනියි.
(2) ලිඛිත සන්නිවේදනයේ දී පණිවිඩය ලබන්නාගේ ඉරියව් අධ්‍යයනය කිරීම අපහසු ය.
(3) පුද්ගල සම්බන්ධතාවලට ඇති කැමැත්ත අවමවීම මනා සන්නිවේදනයට බාධාවක් නොවේ.
(4) නැවත අධ්‍යයනය කිරීමට පහසුවීම ලිඛිත සන්නිවේදනයේ වාසියකි.
(5) වෙනත් ක්‍රියාවක යෙදෙමින් කරනු ලබන සන්නිවේදනය ඵලදායී බවින් අඩු ය.

32. වාචික සන්නිවේදනයේ ලක්ෂණයකි,

(1) පණිවිඩය නිවැරදිව තහවුරු කරගැනීමට අපහසුවීම.
(2) ගොනුගත කිරීම තුළින් නැවත භාවිතයට පහසුවීම.
(3) පණිවිඩයේ අපැහැදිලි තැන් නිවැරදි කරගත හැකිවීම.
(4) පණිවිඩය සාක්ෂියක් ලෙස පසුව ඔප්පු කළ හැකිවීම.
(5) සන්නිවේදකයාට පහසු භාෂාවකින් පණිවිඩය ලබාදිය හැකිවීම.

33. පහත දැක්වෙන්නේ විවේකය සහ ප්‍රතිමෝදනය පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.

A – ක්‍රියාශීලී විවේක ක්‍රියාකාරකම් කාණ්ඩ තුනකට බෙදා ඇත.
B – විවේකය මනා ජීවන රටාවකට බාධා ඇති කරයි.
C – විවේකය සඳහා ප්‍රතිමෝදක ක්‍රියාකාරකම් තෝරාගැනීමේ දී මානව හැසිරීම් සැලකිල්ලට ගත යුතු ය.
D – තාක්ෂණික දියුණුව නිසා ප්‍රතිමෝදක ක්‍රියා සාර්ථක වේ.

මේවායින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A සහ B පමණි. (2) A සහ D පමණි. (3) B සහ C පමණි.
(4) C සහ D පමණි. (5) A, C සහ D පමණි.

34. සමාජීය ප්‍රතිමෝදක ක්‍රියා **පමණක්** ඇතුළත් වරණය තෝරන්න.

(1) ක්‍රීඩා, සාද, ශාරීරික අභ්‍යාස
(2) සාද, චාරිකා, භෝජන සංග්‍රහ
(3) ලී වැඩ, ක්‍රිකට් ක්‍රීඩාව, බතික් කිරීම
(4) චිත්‍ර ඇඳීම, තරඟ, ශාරීරික අභ්‍යාස
(5) චාරිකා, චිත්‍ර ඇඳීම, භෝජන සංග්‍රහ

35. සංචරණය පිළිබඳ සත්‍ය ප්‍රකාශය මින් කුමක් ද?

(1) දේශීය සංචරණය යනු රටක සිටින නේවාසිකයින් ආගන්තුකයින් ලෙස එම රට තුළ කරනු ලබන සංචරණයයි.
(2) සංවිධානාත්මක ලෙස විශාල කණ්ඩායම් සංචාරක ස්ථාන කරා රැගෙන යාම විකල්ප සංචරණය වේ.
(3) වනජීවී ඡායාරූපකරණය සහ කඳුනැගීම ස්වභාවධර්ම සංචරණයට අයත් ක්‍රියාකාරකම් දෙකකි.
(4) ගොවිපළ තුළ නේවාසිකව සිටීම, නිෂ්පාදන ගොවිපොළෙන්ම මිල දී ගැනීම රූදෙස් සංචරණයට අයත් වේ.
(5) පන්තිකාමරයෙන් පිටත දී ඉගෙනුම් අත්දැකීම් ලබාගැනීමත්, සුබසාධන කටයුතුවලට දායකවීමත් අධ්‍යාපනික සංචරණයේ අරමුණු වේ.

36. ස්වාභාවික, මානව නිර්මිත හා මානව පාලිත යන සංචාරක ආකර්ෂණ සඳහා උදාහරණ පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

(1) රිදියාගම වනජීවී උයන, උණවටුන වෙරළ තීරය, දළදා පෙරහර
(2) කෞතුකාගාරය, පින්නවල අලි අනාථාගාරය, උණුදිය උල්පත්
(3) දුන්හිඳ දියඇල්ල, රූකඩ කලාව, උඩවලව වනෝද්‍යානය
(4) උණවටුන වෙරළ තීරය, කුමන කුරුළු පාරාදීසය, ලෝවාමහාපාය
(5) රිදියාගම වනජීවී උයන, අවුකන බුදු පිළිමය, බෝපත් ඇල්ල

37. ගෘහස්ථ ජල සැපයුම හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A – පානීය ජලයෙහි කැඩ්මියම්, ෆ්ලෝරයිඩ්, ක්‍රෝමියම් වැනි රසායන ද්‍රව්‍ය අඩංගු ය.
B – ජල ඒකකයක් යනු ජල ඝන මීටර එකක් හෙවත් ලීටර 1 000 කි.
C – ශ්‍රී ලංකාවේ මුළු ජල පරිභෝජනයෙන් ගෘහස්ථ හා අනෙකුත් කටයුතු සඳහා 15%ක් පමණ වැය වේ.
D – පූතික ටැංකියෙන් පෙඟවුම් වලකට මුදා හරින ලද ජලය ගෙවත්තේ ශාකවලට යොදාගත හැකි ය.

මින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A සහ C පමණි. (2) B සහ C පමණි.
(3) A, B සහ D පමණි. (4) A, C සහ D පමණි.
(5) B, C සහ D පමණි.

38. ගෘහ විදුලි සැපයුම පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) අධිධාරා පරිපථ බිඳිනය හා විදුලි මීටරය විදුලි සැපයුම් ආයතනයට හිමි ය.

(2) සජීවී රැහැන හා උදාසීන රැහැන වෙන්කරණයට සම්බන්ධ කර ඇත.

(3) සිඟිති පරිපථ බිඳින වෙනුවට පැරණි නිවෙස්වල විලායක භාවිත විය.

(4) පහන් පරිපථයක යොදා ඇති ස්විචයන් සම්බන්ධ කරනුයේ සජීවී රැහැනට ය.

(5) කෙවෙණියක වම්පසට භූගත රැහැන සම්බන්ධ කරයි.

39. විද්‍යුත් ශක්තිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) සරල ධාරා විදුලිය ප්‍රධාන විදුලි බල සැපයුම මඟින් ලබා ගනියි.

(2) තාපදීප්ත විදුලි පහන්වලට වඩා සුසංහිත ප්‍රතිදීපන පහන්වල විදුලි ජවය වැඩි ය.

(3) විදුලි ධාරාව මනිනු ලබන ඒකකය ඕම් වේ.

(4) සන්නායකයකින් විදුලි ධාරාවක් කාන්දුවීම වැළැක්වීම පිණිස පරිවාරක යොදා ඇත.

(5) ප්‍රධාන විදුලියේ සංඛ්‍යාතය හර්ට්ස් 100 (Hz) වේ.

40. නිවසක 1500 W විදුලි ඉස්ත්‍රික්කයක් දිනකට විනාඩි 30 බැගින් භාවිත කරයි. මේ සඳහා සතියකට වැයවන විද්‍යුත් ඒකක සංඛ්‍යාව කොපමණ ද?

(1) 5.12 kWh (2) 5.25 kWh (3) 5.46 kWh (4) 5.55 kWh (5) 5.75 kWh

41. ප්‍රීබයොටික් සහ ප්‍රෝබයොටික් පිළිබඳ නිවැරදි වැකිය තෝරන්න.

(1) කිරි නිෂ්පාදනවල ප්‍රීබයොටික් හා ප්‍රෝබයොටික් අඩංගු වේ.

(2) ප්‍රීබයොටික් සහජීවී බැක්ටීරියා විශේෂයකි.

(3) ප්‍රෝබයොටික් වර්ධනයට ආහාරමය තන්තු වැදගත් වේ.

(4) කෙසෙල් හා ලීක්ස් යන ආහාරවල ප්‍රෝබයොටික් අඩංගු වේ.

(5) ප්‍රීබයොටික් මිනිසාගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය ශක්තිමත් කරයි.

42. සම්පත් අවභාවිතය හා සම්බන්ධ පහත කරුණු සලකන්න.

A – අතිරික්ත ජලය ගබඩා වීම

B – පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ඇතිවීම

C – හරිතාගාර ආවරණය

D – දෙමුහුම් වාහන භාවිතය වැඩිවීම

මින් ඇතිවන අහිසි විපාකය/විපාක වනුයේ,

(1) C පමණි. (2) A සහ B පමණි.

(3) A සහ C පමණි. (4) B සහ D පමණි.

(5) B, C සහ D පමණි.

43. ආහාර පා සළකුණු අගයයන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) එළවළුවල මෙම අගය පලතුරුවල අගයට වඩා වැඩි වේ.

(2) ධාන්‍යවල මෙම අගය කිරිවල අගයට වඩා අඩු වේ.

(3) පලතුරුවල මෙම අගය තෙල් තැවරුම්වල අගයට වඩා වැඩි වේ.

(4) මත්ස්‍ය ආහාරවල මෙම අගය ධාන්‍යවල අගයට වඩා අඩු වේ.

(5) කුකුල්මස්වල මෙම අගය කිරිවල අගයට වඩා වැඩි වේ.

44. ආහාර පිසීමේ දී ඇතිවන විමෝචක අවම කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ගයක් වන්නේ මින් කුමක් ද?

(1) වැඩි ද්‍රව ප්‍රමාණයක් යොදා ආහාර පිසීම

(2) විවෘත භාජනයක ආහාර පිසීම

(3) පියන වසා ආහාර පිසීම

(4) විශාල භාජනයක ආහාර පිසීම

(5) ගෑස් උදුන්වල ලෝහ බඳුන්හි ආහාර පිසීම

45. හර්ලොක් විසින් නව යොවුන්විය තුළ සංක්‍රාන්ති අවධිය ලෙස හඳුන්වා ඇත්තේ මින් කුමන වයස් කාණ්ඩය ද?

(1) අවුරුදු 10-12 අතර (2) අවුරුදු 12-14 අතර
(3) අවුරුදු 15-16 අතර (4) අවුරුදු 16-18 අතර
(5) අවුරුදු 19-21 අතර

46. යොවුන් වියේ සංවර්ධනය හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A – චිත්තවේග සංවර්ධනයේ අසමතුලිතතා පෙන්නුම් කරයි.
B – නීතිරීති සමාජ ජීවිතයට හිතකර පරිදි වෙනස් කිරීමට පෙළඹේ.
C – ගැහැණු දරුවන්ගේ අස්ථි මේරීම වයස අවුරුදු 19 වනතෙක් සිදුවේ.

මින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

(1) A පමණි. (2) A සහ B පමණි.
(3) A සහ C පමණි. (4) B සහ C පමණි.
(5) A, B සහ C යන සියල්ල ම ය.

47. දරුවන්ගේ ස්වසංකල්පය වර්ධනයෙහිලා දෙමාපියන් ක්‍රියාකළ යුත්තේ කෙසේ ද?

(1) අධ්‍යාපනයේ ඉහළ අපේක්ෂා ඇති කිරීම
(2) දරුවන් සංසන්දනය කිරීම
(3) ගැටලු විසඳාගැනීමේ දී මැදිහත් වීම
(4) තීරණ ගැනීමේ දී බලපෑම් ඇති කිරීම
(5) දරුවන්ගේ ජයග්‍රහණ දෙස උපේක්ෂාවෙන් බැලීම

48. මානසික පීඩනය සහිත පුද්ගලයකු පෙන්වන කායික ලක්ෂණ මොනවා ද?

(1) කැළඹිලි සහිතබව සහ තිගැස්සීම
(2) ශෝකහරිතබව සහ අලසබව
(3) කැළඹිලි සහිතබව සහ සුසුම් හෙළීම
(4) තිගැස්සීම සහ ශෝකහරිතබව
(5) සුසුම් හෙළීම සහ අලසබව

49. ව්‍යවසායකයකු තුළ තිබිය යුතු ලක්ෂණ මොනවා ද?

(1) අලුත් අදහස් බාරගැනීමට ඇති කැමැත්ත සහ අත්දැකීම්වලින් ඉගෙනගැනීම
(2) වෙනස්වීමට ඇති කැමැත්ත සහ වර්තමානය පිළිබඳ වැඩිපුර සිතීම
(3) ජය පරාජය දෙකෙහිම වගකීම බාරගැනීම සහ පැරණි අදහස්වලට ගරු කිරීම
(4) තම තීරණ මත ක්‍රියාකිරීම සහ වැඩ කිරීම සීමා කිරීම
(5) අත්දැකීම්වලින් ඉගෙනගැනීම සහ ඉහළ ඉලක්ක බලාපොරොත්තු නොවීම

50. පහත කරුණු සලකන්න.

A – සම්පත් පොදුවේ බෙදාහැරීම කළ යුතු ය.
B – වැඩිදියුණු කළහැකි ක්‍රියාවලි හඳුනාගෙන හැකිපමණ ඒ කෙරෙහි යොමුවිය යුතු ය.
C – ව්‍යාපාරයේ සියලු කාර්යයන් සරල කළ යුතු ය.
D – ව්‍යාපාරයේ අභ්‍යන්තර හා බාහිර පරිසරය දියුණු කළ යුතු ය.

මේවායින් ව්‍යාපාරයේ ඵලදායිතාව වැඩි කිරීම සඳහා අනුගමනය කළ යුතු වන්නේ

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ C පමණි. (5) B, C සහ D පමණි.

***

14249

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
Home Economics II

28 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

✳ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

1. (i) 'සුන්දරත්වය' සහ 'නිශ්චල බව' පිළිබිඹු කරන රේඛා වර්ග **දෙක** පිළිවෙළින් සඳහන් කරන්න.

(ii) විකල්ප බලශක්ති ප්‍රභව **දෙකක්** නම් කරන්න.

(iii) ආහාරවල පිෂ්ටය හඳුනා ගැනීම සඳහා සුදුසු රසායනික පරීක්ෂණයක් ලියන්න.

(iv) කැල්සියම් ඌනතාව නිසා ඇතිවිය හැකි රෝග තත්ත්ව **දෙකක්** නම් කරන්න.

(v) නිමි ඇඳුම් කර්මාන්තය ශ්‍රී ලංකාවට වාසිදායක වේ. හේතු **දෙකක්** ඉදිරිපත් කරන්න.

(vi) කෘත්‍රිම කෙඳි නිෂ්පාදනයේ ප්‍රධාන පියවර **දෙක** ලියන්න.

(vii) විවේකය ප්‍රතිමෝදනය සඳහා යොදා ගැනීමේ දී බලපාන සාධක **දෙකක්** සඳහන් කරන්න.

(viii) 'හරිත පාරිභෝගිකයා' යන සංකල්පය හඳුන්වන්න.

(ix) අන්තර්පුද්ගල සබඳතා වර්ධනය සඳහා වැදගත්වන ආචාරධර්ම කාණ්ඩ **දෙකක්** නම් කර, ඒ එකිනෙකට උදාහරණය බැගින් ලියන්න.

(x) යොවුන් අවධිය තුළ සිදුවන වියුක්ත චින්තන හැකියාව පිළිබිඹු කරන ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ලකුණු 02 × 10 = 20 යි.)

2. (i) කාර්යාලයක භූමිය සැකසීම සඳහා යෝග්‍ය වන භූ දර්ශනය කුමක් ද? හේතුව සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(ii) නිවසක් නිර්මාණයේ දී ආර්ථික කළමනාකරණය සඳහා ගත යුතු පියවර **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iii) අභ්‍යන්තර අවකාශ නිර්මාණයේ දී

- අවධාරණය
- සමානුපාතිකබව

පිළිබිඹු කළ හැකි ආකාරය උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iv) පහත සඳහන් විද්‍යුත් උපකරණවල

(a) ශක්ති පරිවර්තනය සහ

(b) ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.

- රෙදි සෝදන යන්ත්‍රය
- විදුලි ලිප
- ක්ෂුද්‍ර තරංග උඳුන

(ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

[දෙවැනි පිටුව බලන්න.

3. (i) බහු අසන්තෘප්ත මේද අම්ල **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ආහාරවේලට මාළු එක් කර ගැනීම වැදගත් වේ. කරුණු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි.)

(iii) දියවැඩියාවෙන් පෙළෙන රෝගියෙකු සඳහා දිනක බොජුන් පතක් සැලසුම් කරන්න. (ලකුණු 05 යි.)

(iv) දුෂ්පෝෂණය ඇතිවීමට බලපාන කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(මුළු ලකුණු 16 යි.)

4. (i) ආහාර පරිරක්ෂණය කිරීමේ මූලධර්ම **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(ii) මේදමය ආහාර 'මුඩුවීම' පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) කෙටි සටහන් ලියන්න.

(a) රික්ත ඇසුරුම්කරණය

(b) ඇසුරුම් ද්‍රව්‍යයක් ලෙස වීදුරු භාවිතය (ලකුණු 08 යි.)

(මුළු ලකුණු 16 යි.)

5. (i) ලිනන්, සේද සහ නයිලෝන් කෙඳි පිළිස්සීමේ දී නිකුත් වන ගන්ධය පිළිවෙළින් සඳහන් කරන්න.

(ලකුණු 03 යි.)

(ii) නිමි ඇඳුම් කර්මාන්තයේ දී ඇඳුම් මසා නිම කිරීමේ ආකාර තුනකි. එම ආකාර **තුන** ලියන්න.

(ලකුණු 03 යි.)

(iii) වර්ණ දෙකක් භාවිත කරමින් සිදුකරන 'ගැට පඬු ක්‍රමය' විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) කමිස ඇසුරුම් කිරීමේ දී අනුගමනය කරන ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(මුළු ලකුණු 16 යි.)

6. (i) තිරසාර සම්පත් පරිභෝජනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 යි.)

(ii) ගෝලීය උෂ්ණත්වය වෙනස්වීම නිසා ඇතිවන බලපෑම් **හතරක්** නම් කර ඉන් **දෙකක්** පැහැදිලි කරන්න.

(ලකුණු 04 යි.)

(iii) පැහැදිලි කරන්න.

(a) ශ්‍රී ලංකාවේ සංචාරකයින් සඳහා සපයන නේවාසික පහසුකම් (ලකුණු 04 යි.)

(b) සංචාරක කර්මාන්තය හා සම්බන්ධ උපකාරක සේවා (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

7. (i) 'මල්වරවීම' හඳුන්වන්න. (ලකුණු 02 යි.)

(ii) මානසික සමබරතාවයෙන් යුත් යෞවනයෙක් පිළිබිඹු කරන ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iii) යෞවනයා මුහුණ දෙන වෘත්තීමය ගැටලු පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iv) යොවුන් දරුවන්ගේ සංවර්ධනය කෙරෙහි සමවයස් කණ්ඩායමේ බලපෑම සාකච්ඡා කරන්න.

(ලකුණු 05 යි.)

(මුළු ලකුණු 16 යි.)

8. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) නිර්මාණයක වටිනාකම කෙරෙහි බලපාන මූලිකාංග

(ii) ස්ථූලතාව පාලනය සඳහා වැදගත් වන ආහාර පුරුදු

(iii) ගෘහපිළි නිර්මාණය කිරීමේ දී භාවිත වන මැහුම් ක්‍රම

(iv) සංචාරකයින් සඳහා ඉදිරිපත් කරන නිවාඩු කාල පැකේජ

(v) යොවුන් අවධිය තුළ සිදුවන සදාචාර වර්ධනය

(ලකුණු $04 \times 4 = 16$ යි.)

* * *

සියලුම හිමිකම් ඇවිරිනි

රහස්‍ය ලේඛනයකි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ. පො. ස. (උසස් පෙළ) විභාගය - 2024

28 - ගෘහ ආර්ථික විද්‍යාව

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිනි. ප්‍රධාන/සහකාර පරීක්ෂක රැස්වීමේදී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධනය ඇතුළත් කළ යුතුව ඇත.

පටුන පිටුව

ලකුණු ප්‍රදානය කිරීම පිළිබඳ සාරාංශය	02
අවසාන ලකුණු ගණනය කිරීම පිළිබඳ උපදෙස්	03
ලකුණු ලැයිස්තු පිළියෙල කිරීම පිළිබඳ උපදෙස්	04
උත්තර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම	05
I පත්‍රයේ අභිමතාර්ථ	07
I පත්‍රයේ ලකුණු දීමේ පටිපාටිය	16
II පත්‍රයේ අභිමතාර්ථ	17
II පත්‍රයේ ලකුණු දීමේ පටිපාටිය	20

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024

28 - ගෘහ ආර්ථික විද්‍යාව II

ලකුණු ප්‍රදානය කිරීමේ සාරාංශය

1. ප්‍රශ්නය (අනිවාර්ය වේ.)

I - 02
II - 02
III - 02
IV - 02
V - 02
VI - 02
VII - 02
VIII - 02
IX - 02
X - 02

ලකුණු 2 X 10 = 20

2. ප්‍රශ්නය

I - 02
II - 04
III - 04
IV – 06

ලකුණු - 16

3. ප්‍රශ්නය

I - 02
II - 04
III - 05
IV – 05

ලකුණු - 16

4. ප්‍රශ්නය

I - 03
II - 05
III - a - 04
b - 04

ලකුණු - 16

5. ප්‍රශ්නය

I - 03
II - 03
III - 05
IV – 05

ලකුණු - 16

6. ප්‍රශ්නය

I - 02
II - 04
III - a - 04
b - 06

ලකුණු - 16

7. ප්‍රශ්නය

I - 02
II - 04
III - 05
IV – 05

ලකුණු - 16

8. ප්‍රශ්නය

I - 04
II - 04
III - 04
IV – 04
V - 04

ලකුණු 4 X 4 = 16

අවසාන ලකුණු ගණනය කිරීම පිළිබඳ උපදෙස්

I පත්‍රයේ අවසාන ලකුණු ගණනය කිරීම.

ප්‍රශ්න අංක 01 සිට 50 දක්වා 50 X 01 = 50

II පත්‍රයේ අවසාන ලකුණු ගණනය කිරීම.

තෝරාගනු ලබන අනෙකුත් ප්‍රශ්න පහට 05 X 16 = ලකුණු 80

එකතුව 20 + 80 = ලකුණු 100

ලකුණු ලැයිස්තු පිළියෙළ කිරීම සඳහා උපදෙස්

- එක් එක් අයදුම්කරුවාට හිමි ලකුණු ලකුණු ලැයිස්තුවේ ප්‍රශ්න අංකවලට අනුකූලව යෙදිය යුතුය.
- ප්‍රශ්න අංකයට ඉදිරියෙන් ප්‍රශ්නයට නියමිත මුල් ලකුණු ප්‍රමාණය සටහන් කරන්න.
- ලකුණු සටහන් කිරීමේදී පැහැදිලිව ඉලක්කම් සටහන් කරන්න.
- ලකුණු ඇතුලත් කිරීමේදී යම් වැරදීමක් සිදුවුවහොත් එක් ඉරකින් කපා කෙටි අත්සන යොදා පැහැදිලිව ලියන්න.
- මැකීම හෝ මකන දියර (Collection Fluid) හෝ භාවිතා නොකරන්න.
- ලකුණු සටහන් කළ හා පරීක්ෂා කරන ලද පරීක්ෂකවරුන් දෙදෙනාම ලකුණු ලැයිස්තුවල අත්සන් කිරීම හා සංකේත අංක යෙදීම කළ යුතු වේ.

උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ....
....
.... √ △ $\frac{4}{5}$

(ii) ....
....
.... √ △ $\frac{3}{5}$

(iii) ....
....
.... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

I පත්‍රයේ අභිමතාර්ථය

බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වන අතර ගෘහ ආර්ථික විද්‍යාව විෂයට අදාළ සියලුම නිපුණතා ආවරණය වන පරිදි මෙම ප්‍රශ්න පත්‍රය සකසා ඇත.

එක් එක් නිපුණතාවයෙහි විෂය කරුණු ඉදිරිපත් කර ඇති ආකාරය සහ ඒවායන් අපේක්ෂිත අරමුණු අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්න අංක 1 - 4 දක්වා ප්‍රශ්න සකස් ඇත්තේ ප්‍රශස්ථ ජීවන පරිසරයක් ඇති කිරීම යන නිපුනතාවයට අදාළවය. 1,2,3 ප්‍රශ්න දැනුම අවබෝධය මැන බැලෙන අතර 4 ප්‍රශ්නය සකස් කර ඇත්තේ දැනුම අවබෝධය, භාවිතය මුල්කර ගනිමින් නිරීක්ෂණය තුළින් විශ්ලේෂතා, ඇගයීම හා නිර්මාණය තුළින් උසස් මානසික හැකියා වැඩි දියුණු කර ගැනීමේ හැකියා ප්‍රගුණ කර ඇති අයුරු මැන බැලේ.

ප්‍රශ්න අංක 5 - 22 දක්වා ඉදිරිපත් කර ඇත්තේ ආහාර හා පෝෂණය සම්බන්ධ නිපුණතාවලට අනුකූලවය. මෙහි ප්‍රශ්න ඉදිරිපත් කර ඇත්තේ දැනුම, අවබෝධය හා භාවිතය හා හැකියාවන් මැන බැලීමට වන අතර පරීක්ෂණය, නිරීක්ෂණය හා නිගමනය මෙන්ම සිසුන් තුළ ඇති ප්‍රායෝගික හැකියා ප්‍රගුණ කර ඇති ආකාරය පිළිබඳව ඇගයීමට ලක් කර ඇත.

ප්‍රශ්න අංක 23 - 30 දක්වා රෙදිපිළි තාක්ෂණය පිළිබඳ විෂය කරුණු පිළිබඳ දැනුම, අවබෝධය භාවිතය යන කුසලතා මැන බැලේ.

ප්‍රශ්න අංක 31 - 32 දක්වා ප්‍රශ්න අන්තර් පුද්ගල සබඳතා වර්ධනය පිළිබඳ දැනුම අවබෝධය හා කුසලතා මැන බලයි.

ප්‍රශ්න අංක 33 - 36 දක්වා ප්‍රශ්න සකසා ඇත්තේ විවේකය ඵලදායීව ලෙස ගත කිරීම හා සංචරණය පිළිබඳ නිපුණතා තුළින් සිසුන් කොතෙක් දුරට ඒ පිළිබඳ දැනුම අවබෝධය භාවිතය පිළිබඳ ප්‍රගුණ කිරීම පිළිබඳව විමසා බැලීමටයි.

ප්‍රශ්න අංක 37 - 40 දක්වා ගෘහයට සැපයෙන සේවාවන් පිළිබඳ දැනුම අවබෝධය භාවිතයට මෙන්ම ආකල්ප ගොඩ නගා ගැනීම සහ ප්‍රායෝගික හැකියා මැන බැලේ.

ප්‍රශ්න අංක 41 - 44 තුළින් සම්පත් ප්‍රශස්ථ ලෙස පරිභෝජනයට හා පරිසර හිතකාමී ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම අවබෝධය හා භාවිතය ද ආකල්ප හා ප්‍රායෝගික කුසලතා ප්‍රගුණ වී ඇති දැයි ඇගයීමට ලක් කෙරේ.

ප්‍රශ්න අංක 45 - 48 ප්‍රශ්න නව යොවුන් විය හා සම්බන්ධ දැනුම, අවබෝධය හා භාවිතය තුළින් නිරීක්ෂණය හා ඇගයීම් ආකල්ප මැන බලයි.

ප්‍රශ්න අංක 49 - 50 ව්‍යවසායකත්වය පිළිබඳ දැනුම, අවබෝධය මැන බැලේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

විෂය අංකය பாட இலக்கம்	28	විෂයය பாடம்	ගෘහ ආර්ථික විද්‍යාව

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
I පත්‍රය/பத்திரம் I

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.
01.	5	11.	3	21.	4	31.	3	41.	1
02.	4	12.	5	22.	2	32.	3	42.	1
03.	3	13.	1	23.	3	33.	5	43.	2
04.	3	14.	5	24.	4	34.	2	44.	3
05.	3	15.	2	25.	1	35.	1	45.	3
06.	1	16.	4	26.	2	36.	3	46.	2
07.	5	17.	4	27.	3	37.	3	47.	1
08.	1	18.	4	28.	5	38.	5	48.	5
09.	2	19.	5	29.	2	39.	4	49.	1
10.	3	20.	1	30.	4	40.	2	50.	5

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

II පත්‍රයේ අභිමතාර්ථය

01. ප්‍රශ්නය
පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ. එමෙන්ම කොටස් 10 කින් සමන්විතය. කෙටි පිළිතුරු අපේක්ෂාවෙන් සකසා ඇති අතර නිපුණතා කිහිපයක් තුළින් ප්‍රශ්න ඉදිරිපත් කර ඇත. මූලික දැනුම, අවබෝධය හා භාවිතය ඇගයීමට අපේක්ෂිතය.

02. ප්‍රශ්නය
ඉදිරිපත් කර ඇත්තේ ප්‍රශස්ථ ජීවන පරිසරය හා සම්බන්ධ නිපුණතා මට්ටම් සහ නිර්මාණයේ මූලික සාධක, මූලිකාංග හා මූලධර්ම පිළිබඳ නිපුණතාව සහ ගෘහීය සේවාවන් පිළිබඳ නිපුණතාවට අනුකූලවයි. එම විෂය කරුණු පිළිබඳ දැනුම, අවබෝධය, භාවිතය, ප්‍රායෝගික හැකියා ඇගයීම මැන බැලීම අපේක්ෂිතය.

03. ප්‍රශ්නය
ආහාර හා පෝෂණය පිළිබඳ නිපුණතාවලට අනුකූලව ඉදිරිපත් කර ඇති අතර, පෝෂ්‍ය පදාර්ථ අහාර කාණ්ඩ විවිධ බෝනොවන රෝග හා සම්බන්ධ විෂය කරුණු ඇතුලත්ය. ඒ පිළිබඳව දැනුම, ආකල්ප හා ප්‍රයෝගිකව කුසලතා පිළිබඳව මැන බලයි.

04. ප්‍රශ්නය
මෙම ප්‍රශ්නය ආහාර පරිරක්ෂණය, විවිධ ආහාරවල ස්වභාවය හා ඇසුරුම් කිරීම පිළිබඳ විෂය කරුණු ඇතුළත්ය. සිසුන් තුළ ඒ පිළිබඳ දැනුම, අවබෝධය භාවිතය සහ ආකල්ප ප්‍රගුණ වී ඇති දැයි ඇගයීමට ලක් කෙරේ.

05. ප්‍රශ්නය
මෙම ප්‍රශ්න ඉදිරිපත් කර ඇත්තේ රෙදිපිළි තාක්ෂණය හා ඇඟලුම් කර්මාන්තයට අදාළවයි. මෙහිදී ඒ පිළිබඳව දැනුම, අවබෝධය භාවිතය සහ ආකල්ප ප්‍රගුණ වී ඇති දැයි ඇගයීමට ලක් කෙරේ.

06. ප්‍රශ්නය
මෙම ප්‍රශ්නය සකසා ඇත්තේ සම්පත් පරිභෝජනය හා හිතකාමී පරිසරය ගොඩනැගීම පිළිබඳ විෂය කරුනු හා සංචාරණය සම්බන්ධ විෂය කරුණු සම්බන්ධවයි. ඒ පිළිබඳ දැනුම, අවබෝධය හා ආකල්ප ගොඩනගා ගැනීම පිළිබඳ මැන බැලීම අපේක්ෂිතය.

07. ප්‍රශ්නය
යොවුන් විය හා සම්බන්ධ ව ඉදිරිපත් කර ඇති මෙම ප්‍රශ්නය තුළින් යොවුන් වියේ දරුවන්ගේ සංවර්ධනයට හේතු වන මෙන්ම අහිතකර ලෙස බලපාන සාධක පිළිබඳ දැනුම අවබෝධය, නිරීක්ෂණය, ආකල්ප, විශ්ලේෂණ හැකියා මැන බැලීමට අපේක්ෂිතය.

08. ප්‍රශ්නය
නිපුණතා කිහිපයක් ඔස්සේ ඉදිරිපත් කර ඇති මෙම ප්‍රශ්නය තුළින් ඒවා පිළිබඳ දැනුම, අවබෝධය, නිරීක්ෂණ හැකියා ඉදිරිපත් කර ඇති ආකාරය ඇගයීමට ලක් කෙරේ.

II පත්‍රය

1. (i) 'සුන්දරත්වය' සහ 'නිශ්චල බව' පිළිබිඹු කරන රේඛා වර්ග **දෙක** පිළිවෙළින් සඳහන් කරන්න.

- සුන්දරත්වය - වක්‍ර රේඛා
- නිශ්චල බව - තිරස් රේඛා

(ලකුණු 02)

(ii) විකල්ප බලශක්ති ප්‍රභව **දෙකක්** නම් කරන්න.

- සූර්ය කෝෂ
- ජීව වායු ඒකක
- කුඩා පරිමාණ ජල විදුලි බලාගාර
- සුළං බලය
- උදම්රළ

(ලකුණු 02)

(iii) ආහාරවල පිෂ්ටය හඳුනා ගැනීම සඳහා සුදුසු රසායනික පරීක්ෂණයක් ලියන්න.

- තනුක පිෂ්ඨ ද්‍රාවනයක් හෝ පිෂ්ඨය අඩංගු ආහාරයකට අයඩින් බිංදු කිහිපයක් එකතු කිරීම.
- පිෂ්ඨය අඩංගු නම් මිශ්‍රණය තද නිල්, තද දම්, පසුව කළු පැහැය ඇති වේ.

(ලකුණු 02)

(iv) කැල්සියම් ඌනතාව නිසා ඇතිවිය හැකි රෝග තත්ත්ව **දෙකක්** නම් කරන්න.

- අස්ථි විකෘතිරෝගය/ රිකට්ස් (රිකට්සියාව)
- අස්ථි මාර්දවය/ ඔස්ටියෝ මැලේෂියා
- අස්ථි ක්ෂීණතාවය/ ඔස්ටියෝපොරෝසිස්

(ලකුණු 02)

(v) නිමි ඇඳුම් කර්මාන්තය ශ්‍රී ලංකාවට වාසිදායක වේ. හේතු **දෙකක්** ඉදිරිපත් කරන්න.

- විශාල වශයෙන් රැකියා අවස්ථා ජනිත වීම
- උසස් අධ්‍යාපන අවස්ථා විවර වීම
- දළ දේශීය නිෂ්පාදනයට දායක වීම
- ඇඟලුම් කර්මාන්තයේ පවතින තරඟකාරිත්වය නිසා විවිධ පර්යේෂණවලට සහ නව නිපයුම්වලට යොමුවීම
- විදේශ විනිමය රටට ගලා ඒම
- නව තාක්ෂණය හඳුන්වා දීම මගින් ඒ හා සම්බන්ධ වෙනත් කර්මාන්ත සඳහා යොදාගත හැකි තාක්ෂණික ක්‍රම සහ යන්ත්‍ර සූත්‍රවල දියුණුව.

(ලකුණු 02)

(vi) **කෘත්‍රිම කෙඳි නිෂ්පාදනයේ ප්‍රධාන පියවර දෙක ලියන්න.**

- රසායනික ද්‍රව්‍ය ක්‍රියාකාරිත්වය මගින් කෙඳි නිෂ්පාදනය සඳහා අවශ්‍ය පොලිමර් ලබා ගැනීම
- පොලිමර් කෙඳිබවට පත් කිරීම

(ලකුණු 02)

(vii) **විවේකය ප්‍රතිමෝදනය සඳහා යොදා ගැනීමේ දී බලපාන සාධක දෙකක් සඳහන් කරන්න.**

- වැය කළ හැකි මුදල
- යොදා ගත හැකි කාලය
- තාක්ෂණික දියුණුව
    - ප්‍රවාහනය සහ ප්‍රවේශ හැකියාව
    - සුවපහසුව
    - තොරතුරු ව්‍යාප්ත වීම
    - සන්නිවේදනය
- ආකල්ප
- පහසුකම්,
    - යටිතල පහසුකම් සංවර්ධනය
    - සතුටු උයන්
    - විනෝද උද්‍යාන
    - හෝටල්සේවා
    - ප්‍රතිමෝදක ආයතන
- සමාජීය බලපෑම

  පෞද්ගලික ආකල්ප, සමාජ පසුබිම, සමාජ පීඩනය බලපෑම් ඇති කරයි.
- ආරක්ෂාව සඳහා නිදහස
    - තෝරාගත් ස්ථානයේ පවතින ආරක්ෂාව
    - නිදහසේ ගමන් කිරීමේ හැකියාව
    - සමහර ක්‍රියාකාරකම් පාලනය කරන නීතිරීති

(ලකුණු 02)

(viii) **'හරිත පාරිභෝගිකයා' යන සංකල්පය හඳුන්වන්න.**

- භාණ්ඩ හා සේවා සපයා ගැනීමේදී/ මිලදී ගැනීමේදී හැකිතාක් දුරට ස්වභාවික පරිසරය ආරක්ෂා වන පරිදි තෝරා ගැනීම සිදු කරන පාරිභෝගිකයාය.

(ලකුණු 02)

(vi) කෘත්‍රිම කෙඳි නිෂ්පාදනයේ ප්‍රධාන පියවර දෙක ලියන්න.

- රසායනික ද්‍රව්‍ය ක්‍රියාකාරීත්වය මගින් කෙඳි නිෂ්පාදනය සඳහා අවශ්‍ය පොලිමර් ලබා ගැනීම
- පොලිමර් කෙඳිබවට පත් කිරීම

(ලකුණු 02)

(vii) විවේකය ප්‍රතිමෝදනය සඳහා යොදා ගැනීමේ දී බලපාන සාධක දෙකක් සඳහන් කරන්න.

- වැය කළ හැකි මුදල
- යොදා ගත හැකි කාලය
- තාක්ෂණික දියුණුව
    - ප්‍රවාහනය සහ ප්‍රවේශ හැකියාව
    - සුවපහසුව
    - තොරතුරු ව්‍යාප්ත වීම
    - සන්නිවේදනය
- ආකල්ප
- පහසුකම්,
    - යටිතල පහසුකම් සංවර්ධනය
    - සතුටු උයන්
    - විනෝද උද්‍යාන
    - හෝටල්සේවා
    - ප්‍රතිමෝදක ආයතන
- සමාජීය බලපෑම

  පෞද්ගලික ආකල්ප, සමාජ පසුබිම, සමාජ පීඩනය බලපෑම් ඇති කරයි.
- ආරක්ෂාව සඳහා නිදහස
    - තෝරාගත් ස්ථානයේ පවතින ආරක්ෂාව
    - නිදහසේ ගමන් කිරීමේ හැකියාව
    - සමහර ක්‍රියාකාරකම් පාලනය කරන නීතිරීති

(ලකුණු 02)

(viii) 'හරිත පාරිභෝගිකයා' යන සංකල්පය හඳුන්වන්න.

- භාණ්ඩ හා සේවා සපයා ගැනීමේදී/ මිලදී ගැනීමේදී හැකිතාක් දුරට ස්වභාවික පරිසරය ආරක්ෂා වන පරිදි තෝරා ගැනීම් සිදු කරන පාරිභෝගිකයාය.

(ලකුණු 02)

(ix) අන්තර්පුද්ගල සබඳතා වර්ධනය සඳහා වැදගත්වන ආචාරධර්ම කාණ්ඩ දෙකක් නම් කර, ඒ එකිනෙකට උදාහරණය බැගින් ලියන්න.

- සමාජ ආචාර ධර්ම
    - සංවාද ගොඩ නැගීමේ ආචාර ධර්ම
    - වැඩිහිටියන්ට ගරු කිරීම
- ව්‍යාපාර අචාර ධර්ම
    - ගනුදෙනුකරු සමග සුහදසිලි බව
    - ගණුදෙනු කිරීමේ පාරදෘශ්‍ය බව
    - තොරතුරුවල රහස්‍ය බව සුරැකීම
- ආහාර ගැනීමේ ආචාර ධර්ම
    - තලු නොමරා ආහාර ගැනීම
    - වැඩිහිටියන්ට සහ කුඩා දරුවන්ට පළමුව ආහාර පිළිගැන්වීම
    - සියලුම දෙනා අහාර ගෙන අවසන් වනතෙක් කෑම මේසයේ රැඳී සිටීම
    - මුඛය තුළ ආහාර රඳවාගෙන කථා කිරීමෙන් වැලකීම

(ලකුණු 02)

(x) යොවුන් අවධිය තුළ සිදුවන වියුක්ත චින්තන හැකියාව පිළිබිඹු කරන ලක්ෂණ දෙකක් ලියන්න.

- තර්කානුකූලව සිතීම
- වාද විවාද කිරීමේ හැකියාව
- තර්ක විතර්ක ඉදිරිපත් කිරීම
- විචාරවත් බව
- සංකල්ප සාධනය
- ගැටලු විසඳීම
- තීරණ ගැනීම
- විකල්ප ඉදිරිපත් කිරීම

(ලකුණු 02)

(මුළු ලකුණු 02 x 10 = 20 යි)

2. (i) කාර්යාලයක භූමිය සැකසීම සඳහා යෝග්‍ය වන භූ දර්ශනය කුමක් ද? හේතුව සඳහන් කරන්න.

දෘඪ භූදර්ශනය

- පිවිසීමේ මාර්ග සකස් කිරීමට හැකි වීම
- පඩි පේළි සකස් කළ හැකි වීම
- ශාක මල්ගස් විවිධ හැඩවලට කැපීම
- වාහන නවත්වන ස්ථානවලට ගල් ඇල්ලීම
- ආබාධිත අය සඳහා ගමන් කිරීමට ආනත තල සකස් කිරීම
- ගොඩනැගිල්ල ගැලපෙන පරිදි සකස් කිරීමට හැකි වීම
  උදා :- ආසන, සංසරණ මාර්ග ආදිය
- ස්ථාන හඳුනා ගැනීමට ප්‍රතිමා හා මූර්ති නිර්මාණය කිරීම
- නැවතුම් කාමර (Waiting Room) සකස් කළ හැකි වීම
- ආරුක්කු පාලම් යෙදීමට හැකි වීම

(ලකුණු 02)

(ii) නිවසක් නිර්මාණයේ දී ආර්ථික කළමනාකරණය සඳහා ගත යුතු පියවර හතරක් ලියන්න.

- නිර්මාණය සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය පහසුවෙන් ලබා ගැනීම
- ස්වභාවික ආලෝකය ලබා ගැනීම තුළින් කෘතිම ආලෝකය සඳහා යන වියදම අවම වීම
- වියදම් වන මුදල් ප්‍රමාණය ආර්ථික තත්ත්වය සමඟ ගැලපීම
- නිවසේ සමස්ථ ප්‍රමාණය පවුලේ අවශ්‍යතා හා අංගවලට අනුකූලව සකස් කිරීම
- සූර්ය පැනල භාවිතයට යොදා ගැනීම
- වැසි ජල සංරක්ෂණ ක්‍රම භාවිතයට ගැනීම
- තමා සතු මුදල අනුව අවශ්‍ය දෑ එකතු කිරීම
- වියදම් කළ හැකි මුදලට සාපේක්ෂව නිවස තැනීමට කටයුතු කිරීම
- ණය පහසුකම් ලබා ගැනීමේදී තමන්ට දැරිය හැකි ආකාරයට කටයුතු කිරීම.

(ලකුණු 04)

(iii) අභ්‍යන්තර අවකාශ නිර්මාණයේ දී
- **අවධාරණය**
- **සමානුපාතිකබව**

පිළිබිඹු කළ හැකි ආකාරය උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

- අවධාරණය

උදාහරණ :-

- කෑම කාමරයේ මේසය සඳහා අලංකාර මල් සැරසිල්ලක් තැබීම
- කාමරයේ අනෙකුත් භාණ්ඩ හා උපාංගවලට වඩා ඇස ගැටෙනසේ අලංකාර බිත්ති සැරසිල්ලක් තැබීම
- සරල පුටු කට්ටලයක් සහිත විසිත්ත කාමරයකට අලංකාර බුමුතුරුණක් දැමීම
- කෑම මේසයේ මධ්‍යයේ විශාල ලාම්පු ආවරණයක් එල්ලීම

- සමානුපාතික බව

උදාහරණ :-

- කුඩා කාමරයකට කුඩා ගෘහ භාණ්ඩ තැබීම
- සෘජු කෝණී හැඩැති කාමර සඳහා දිගින් වැඩි ගෘහ භාණ්ඩ තැබීම
- උස් ටීපෝවක් මතට උසින් වැඩි මල් සැකසුමක් තැබීම
- විශාල කාමරයක බිත්තියකට විශාල පින්තූරයක් එල්ලීම

(ලකුණු 04)

(iv) පහත සඳහන් විද්‍යුත් උපකරණවල
(a) ශක්ති පරිවර්තනය සහ
(b) ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.
- රෙදි සෝදන යන්ත්‍රය
- විදුලි ලිප
- ක්ෂුද්‍ර තරංග උඳුන

(a) රෙදි සෝදන යන්ත්‍රය

විද්‍යුත් ශක්තිය → චාලක ශක්තිය

විදුලි ලිපි

විද්‍යුත් ශක්තිය → තාප ශක්තිය

ක්ෂුද්‍ර තරංග උඳුන

විද්‍යුත් ශක්තිය → විද්‍යුත් චුම්භක විකිරණ ශක්තිය නිසා නිපදවෙන ක්ෂුද්‍ර තරංග

(b) රෙදි සෝදන යන්ත්‍රය ක්‍රියාකාරිත්වය :-

මෙහි ඇති මෝටරය විද්‍යුත් ශක්තිය මගින් ක්‍රියාත්මක වේ. විද්‍යුත් ශක්තිය චාලක ශක්තිය බවට පත් වී කැලතීමේ දී ක්ෂාලක මිශ්‍ර ජලය සමඟ ඇතිවන ගැටීම නිසා රෙදිවල කුණු ඉවත් වේ.

විදුලි ලිප ක්‍රියාකාරිත්වය :-

විද්‍යුත් සන්නායකයකින් සෑදූ තාපන දඟරය රත්වී ආහාරය පිසීමට ලක් වේ.

ක්ෂුද්‍ර තරංග උඳුන :-

උඳුන තුළ විද්‍යුත් චුම්භක විකිරණය මගින් නිපදවෙන ක්ෂුද්‍ර තරංග ක්‍රියාකාරී වීම නිසා පිසීමට තැබූ ආහාර තුළ තාපය නිපදවේ. ඒ සඳහා අහාරයේ අඩංගු ජල අංශුවල කම්පනය වැදගත් වේ. එම තාපය මගින් ආහාරය ඉක්මනින් රත්වී පිසීමට ලක් වේ.

(ලකුණු 06)

(මුළු ලකුණු 16)

3. (i) **බහු අසන්තෘප්ත මේද අම්ල දෙකක් නම් කරන්න.**

(1) ඇල්ෆා ලිනෝලෙනික් අම්ලය (ඔමේගා 3 මේද අම්ල)
(2) ලිනෝලෙයික් අම්ලය (ඔමේගා 6 මේද අම්ල)
(3) ඇරකිඩොනික් අම්ලය

(ලකුණු 02)

(ii) **ආහාරවේලට මාළු එක් කර ගැනීම වැදගත් වේ. කරුණු හතරක් දක්වන්න.**

- දෛනික ශක්ති අවශ්‍යතාවයෙන් 10-15% ප්‍රමාණයක් ප්‍රෝටීන්වලින් ලැබිය යුතු නිසා මාළු ප්‍රෝටීන ප්‍රභවයක් ලෙස ශක්තිය සපයයි.
- ඉහළ ගුණාත්මක ප්‍රෝටීන (සම්පූර්ණ ප්‍රෝටීන/ අත්‍යවශ්‍ය අමයිනෝ අම්ල/ ජෛව විද්‍යාත්මක අගය ඉහළ ප්‍රෝටීන) මාළුවල අඩංගු නිසා මාළු සත්ව ප්‍රෝටීනයක් ලෙස වැදගත් වේ.
- අත්‍යවශ්‍ය මේද අම්ල වන ඔමේගා 3 නම් හිතකර මේද අම්ල අඩංගු නිසා එමගින් බෝනොවන රෝග (දියවැඩියාව, ස්ථුලතාව) වැළඳීමේ අවදානම අඩු කරයි.
- කැල්සියම් බහුලව අඩංගු නිසා අස්ථි, දත්වල නිරෝගීභාවයට වැදගත් වේ.
- විටමින් A,B කාණ්ඩය සහ D ලබාදීමට මාළු වැදගත් වේ.
- මාළුවල හීම් යකඩ අඩංගු නිසා ජීරණයට පහසු අතර, අවශෝෂණය ඉහළ මට්ටමක ඇත.
- සින්ක්, සෙලෙනියම් හා අයඩින් වැනි ඛනිජ සපයයි.

(කරුණු 04 ට ලකුණු 04)

(iii) **දියවැඩියාවෙන් පෙළෙන රෝගියෙකු සඳහා දිනක බොජුන් පතක් සැලසුම් කරන්න.**

- මේදය සහ සීනි අධික ආහාර පාලනය
- තම්බන ලද නිවුඩු සහිත සහල්, ආටාපිටි, මාෂ බෝග සහ රනිල බෝග, එළවළු, පළතුරු, පලාවර්ග වැනි තන්තු බහුල ආහාර වැඩිපුර එකතු කිරීම.
- කිරිගු පිටි අඩංගු ආහාර (බේකරි නිෂ්පාදන), දෙල්, කොස්, අලවර්ග හැකි තාක් අඩංගු කර නොතිබීම.
- සත්ව තෙල්, චීස්, බටර්, යොදය සහිත කිරි වර්ග, අයිස් ක්‍රීම්, වටලප්පන්, සීනි, පැණි, හකුරු, චොක්ලට් ටොෆි වර්ග වැනි ආහාර ඇතුළත් නොකිරීම.
- පෝෂ්‍යදායී හා ශක්තිය අඩු ප්‍රධාන ආහාරවේල් තුන සහ අතර මැද කෙටි ආහාර වේල් දෙකක් ඇතුළත් කිරීම.

  උදා : කෙටි ආහාර ලෙස පලතුරු, පලතුරු සලාද හෝ වෙනත් ගැලපෙන පෝෂ්‍යදායී ආහාරයක් අඩංගු වීම
- ප්‍රධාන ආහාර ගත් විගස අතුරුපස ලබා දීම නොකළ යුතුය. (සම්පූර්ණ බොජුන්පතේ එක් වේලකට හෝ ආහාර වේලෙන් පසුව අතුරුපස ලබා දී ඇත් නම් 01 ලකුණක් අහිමිවේ.)
- බේක් කිරීම, වාෂ්පයෙන් තැම්බීම, රෝස්ට් කිරීම, ස්ටූ කිරීම ආදී පිසීමේ ක්‍රම භාවිතය. (ගැඹුරු තෙලේ බැදීම් සීමා කළ යුතු ය.)

(ලකුණු 05)

(iv) දුෂ්පෝෂණය ඇතිවීමට බලපාන කරුණු පැහැදිලි කරන්න.

- දිළිඳු බව
- පෝෂණය පිළිබඳ අඩු අධ්‍යාපනය/ දැනුම අඩු වීම
- සමබර ආහාර වේලක් නොගැනීම
- ආගමික සංස්කෘතිය හා විවිධ පුරුදු
- පෝෂණය පිළිබඳ මිත්‍යා මත පැවතීම නිසා පෝෂණය සහිත සමබර ආහාරවේලක් නොගැනීම
- කාර්ය බහුල ජීවිතය නිසා පෝෂක අඩංගු ආහාර නොගැනීම
- ක්‍රියාශීලී බව වැඩි වීම (අධි පෝෂණය)
- ක්‍රියාශීලී බව අඩු වීම (මන්ද පෝෂණය)

(ලකුණු 05)

(මුළු ලකුණු 16)

4. (i) ආහාර පරිරක්ෂණය කිරීමේ මූලධර්ම තුනක් සඳහන් කරන්න.

- ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය නිශේධනය කිරීම
- රසායනික ප්‍රතික්‍රියා නිශේධනය කිරීම
- කෘමි හානිය වැළැක් වීම
- එන්සයිම අක්‍රිය කිරීම
- භෞතික හානි අවම කිරීම

(ලකුණු 03)

(ii) මේදමය ආහාර 'මුඩුවීම' පැහැදිලි කරන්න.

විවිධ ප්‍රතික්‍රියා නිසා තෙල් සහ මේද සහිත ආහාර රසායනික පරිහානියට පත් වී අප්‍රසන්න රසයක් හා ගන්ධයක් ඇති වීම මේද මුඩු වීමය.

මීට හේතු :-

- ඔක්සිකරණය නිසා මුඩු වීම
- ක්ෂුද්‍ර ජීවීන් නිසා මුඩු වීම
- ජල විච්ඡේදනය නිසා මුඩු වීම

ඔක්සිකරණය සිදුවන ආකාර දෙකකි.

- ස්වයං ඔක්සිකරණය
- එන්සයිමීය ඔක්සිකරණය

ස්වයං ඔක්සිකරණය :- ආහාරවල ඇති ලිපිඩ ඔක්සිජන්වලට හෝ ආලෝකයට නිරාවරණය වීම නිසා වියෝජනය වේ. මේ තුළින් වෙනත් සංයෝග සාදයි.

එන්සයිමීය ඔක්සිකරණය :- ජලය හා ලිපිඩ අතර ප්‍රතික්‍රියාව ශාක මේදවල ඇති එන්සයිම මගින් උත්ප්‍රේරණය වී විවිධ සංයෝග සෑදීම එන්සයිමීය මුඩු වීමයි.

- මුඩුවීමේ ක්‍රියාවලිය වේගවත් කරන සාධක ලෙස
  - උෂ්ණත්වය
  - ආලෝකය
  - ජලය
  - කාලය
  - උත්තේජක

(ලකුණු 05)

(iii) කෙටි සටහන් ලියන්න.

(a) රික්ත ඇසුරුම්කරණය

ආහාර ඇසුරුම තුළ වාතය ඉවත් කර වාත ප්‍රතිරෝධි ලෙස සංහිරණය (Seal) කිරීම රික්ත ඇසුරුම් ක්‍රමයයි.සමහර ආහාර රික්ත ඇසුරුම්කරණය කර ශීතකරණය තුළ තැබිය යුතු ය.එයට හේතුව ලෙස නිර්වායු ක්ෂුද්‍ර ජීවීන් ක්‍රියාත්මක වීම අඩපන කිරීමයි.

මෙම ක්‍රමයේ වාසි ලෙස,

- ආහාරයේ තෙතමනය ඉවත් නොවේ
- හැකිලීම සිදු නොවේ.
- ආහාර ශීත දැවීමට හෝ ඔක්සිකරණයට ලක් නොවේ.
- මස් මාලු මෘදු බවට පත් නොවේ
  (රටඉඳි, මස්, මාලු මේ ක්‍රමයට අසුරණු ලැබේ.)

(ලකුණු 04)

(b) ඇසුරුම් ද්‍රව්‍යයක් ලෙස විදුරු භාවිතය

පළතුරු යුෂ, ජෑම්, කිරි, ඇසිරීමට යොදා ගනී.

වාසි,

- ඉහළ උෂ්ණත්වයට ඔරොත්තු දීම
- ආහාර ද්‍රව්‍ය සමඟ ප්‍රතික්‍රියා නොකිරීම
- දෘඪ ඇසුරුමක් නිසා ආරක්ෂාව සැලසීම
- තෙතමනය, වාතය, ගන්ධය හා ක්ෂුද්‍ර ජීවීන්ට ඇතුලු විය නොහැකි වීම
- ඇතුලත ඇති නිෂ්පාදනය දෘෂ්‍යමාන වීම

අවාසි,

- බර වැඩි වීම
- බිඳෙන සුළු වීම

(ලකුණු 04)

(මුළු ලකුණු 16)

5. (i) ලිනන්, සේද සහ නයිලෝන් කෙඳි පිළිස්සීමේ දී නිකුත් වන ගන්ධය පිළිවෙළින් සඳහන් කරන්න.

- ලිනන් - කඩදාසි පිලිස්සෙන ගන්ධය
- සේද - පිහාටු පිලිස්සෙන ගන්ධය
- නයිලෝන් - රසායනික ගන්ධයක් නිකුත් වේ.

(ලකුණු 03)

(ii) නිමි ඇඳුම් කර්මාන්තයේ දී ඇඳුම් මසා නිම කිරීමේ ආකාර තුනකි. එම ආකාර තුන ලියන්න.

01. එක් පුද්ගලයකු විසින් සම්පූර්ණ ඇඳුම මැසීම
02. ඇඳුමේ විවිධ කොටස් විවිධ පුද්ගලයන් විසින් මැසීම
03. කුඩා කණ්ඩායමක් එක්ව එක් ඇඳුමක් මසා නිම කිරීම

(කරුණු 03 ට ලකුණු 03 යි)

(iii) වර්ණ දෙකක් භාවිත කරමින් සිදුකරන 'ගැට පඬු ක්‍රමය' විස්තර කරන්න.

- රෙද්දේ අවශ්‍ය ස්ථානවලට ගැට යෙදීම
- ගැට යොදා සකස් කර ගත් රෙද්ද පළමු වර්ණයේ සායම් බඳුනේ බහා තැබීම
- ගැට සමඟම රෙද්ද වියලා ගැනීම
- වියලුණු පසු නැවත ගැට යොදා (අවශ්‍ය ස්ථානවල) දෙවනි වර්ණයේ ගිල්වීම
- වියළීමට භාජනය කර ගැට ඉවත් කිරීමෙන් පසු සෝදා වේලා ගැනීම

ඉහත මූලික ක්‍රමයට අමතරව විවිධ රටා ලබා ගැනීම සඳහා ආදේශක ක්‍රමද භාවිත වේ.

(ලකුණු 05 යි)

(iv) කමිස ඇසුරුම් කිරීමේ දී අනුගමනය කරන ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

- කමිසය නැවීමේදී විවරය ඉදිරිපසට සිටින සේ නැවීම
- ඝන කඩදාසියක්/ කාඩ්බෝඩ් එකක් ඇතුළට දැමීම
- කමිස කරපටිය වටා ප්ලාස්ටික්/ කාඩ්බෝඩ් රැඳවුමක් තැබම.
- අල්පෙනිති ගැසීම/ ක්ලිප් ගැසීම (අවශ්‍ය ස්ථානවලට)
- ලේබල් කිරීම
- පොලිතින්වල හෝ පෙට්ටිවල ඇසිරීම

(ලකුණු 05 යි)
(මුළු ලකුණු 16)

6. (i) තිරසාර සම්පත් පරිභෝජනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

- සම්පත් අවම ලෙස භාවිතය
- අපද්‍රව්‍ය හා දූෂිත විමෝචනය සීමා වීම
- අනාගත පරපුරේ අවශ්‍යතා සඳහා සම්පත් උවදුරට පත් නොකිරීම
- දේශීය ආහාර භෝග පරිභෝජනය
- පරිසර දූෂණය අවම වන සේ ක්‍රියා කිරීම

(ලකුණු 02 යි)

(ii) ගෝලීය උෂ්ණත්වය වෙනස්වීම නිසා ඇතිවන බලපෑම් හතරක් නම් කර ඉන් දෙකක් පැහැදිලි කරන්න.

ග්ලැසියර් දිය වීම :- මුහුදු මට්ටම ඉහළ යෑම තුළින් වෙරළ ආසන්න ප්‍රදේශ ජලයෙන් යට වීම.

පරාග වියළීම :- බෝග අස්වනු හා ඵලදාව අඩු වීම

පානීය ජල අර්බුදය :- නියඟය ඇති වීම, රෝගී තත්ත්වයන් වැඩි වීම

ජීවීන් වඳ වී යාම :- පරිසරයේ පැවැත්මට හානි වීම

ආහාර සුරක්ෂිත තාවය අඩු වීම :- පෝෂණමය ගැටලු මතු වීම

වසංගත රෝග වැඩි වීම :- මැලේරියා, බරවා, ඩෙංගු

හරිතාගාර වායු නිසා ඕසෝන් ස්ථරයට හානි සිදු වීම :- අහිතකර පාරජම්බුල කිරණ (UV) පෘථිවියට පැමිණීම හේතුවෙන් චර්ම රෝග හමේ පිළිකා ඇති වේ.

(ලකුණු 04 යි)

(iii) පැහැදිලි කරන්න.

(a) ශ්‍රී ලංකාවේ සංචාරකයින් සඳහා සපයන නේවාසික පහසුකම්

- වර්ගීකරණය කළ හෝටල් - (Classified Hotels) ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ ලියා පදිංචි තරු පන්ති හෝටල් මේ වර්ගයට අයත් වේ. උදා :- තරු 01 සිට 05 දක්වා හෝටල්
- වර්ගීකරණය නොකළ හෝටල් - (Unclassified Hotels) තරු පන්තියේ හෝටල් ලෙස ලියා පදිංචියට අවශ්‍ය සුදුසුකම් සපුරා නැති හෝටල් මෙම වර්ගීකරණයටකට ගැනේ. විවිධ තේමා (Themes) පසුබිම්කර ගෙන ඉදිකරන හෝටල් නිදසුන් වේ. ඒවා බුටික් හෝටල් ලෙස හැඳින් වේ. මේවාට සුවිශේෂී ඉල්ලුමක් පවතින බැවින් ඉතා ඉහළ මිල ගණන්වලට අලෙවි වේ.
- ආදේශක නවාතැන් - තානායම්, ආගන්තුක නිවාස, ගෘහ ආශ්‍රිත නවාතැන් (Homestay) සංචාරක බංගලා, ප්‍රවේණි බංගලා ආදිය උදාහරණ වේ. මේවා (SLTDA) යටතේ විධිමත්ව ලියා පදිංචි විය යුතුය.

දෙකක් පැහැදිලි කිරීම අපේක්ෂා කෙරේ.

(ලකුණු 04 යි)

(b) සංචාරක කර්මාන්තය හා සම්බන්ධ උපකාරක සේවා

සංචාරකයින්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා සංචාරක කර්මාන්තයේ නියැලෙන්නන්ට සහ ආයතනවලට සහනසේවා ලබාදීමට ද විවිධ අංශ රැසක් දායක වේ. මේවා උපකාරක සේවා අංශය ලෙස හඳුන්වයි. මෙම උපකාරක සේවා නම්,

- මුල්‍ය ආයතන - විනිමය හුවමාරුව, සංචාරක චෙක්පත්, ණයවර කාඩ් (Credit cards) පහසුකම ලබා දීම
- සන්නිවේදන සේවා - විදුලි සන්දේශ සේවා, අන්තර් ජාල පහසුකම්, පාරිභෝගික සේවා
- සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා - සංචාරකයින් සඳහා සුරක්ෂිත පරිසරය, පිරිසිදු පානීය ජලය, සංචාරක ආයතන සෞඛ්‍ය ආරක්ෂිත ප්‍රමිතිය සංචාරකයන්ගේ ශරීර සෞඛ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සෞඛ්‍ය පිළිබඳ වාර්තා කිරීමේ ක්‍රම වේදයන්, නිරෝධායන පහසුකම් පවත්වාගෙන යාම.
- රක්ෂණ ආයතන - සංචාරක රක්ෂණ (Travel insurance)
- සංචාරක තොරතුරු සේවා - සංචාරක ප්‍රකාශනයන් උපදෙස් පොත් සඟරා, තොරතුරු මධ්‍යස්ථාන හා ප්‍රකාශන ආයතන
- පොදු ආරක්ෂාව - සංචාරක පොලිසිය, ගමන් යන්නන් සහ සංචාරකයන් සඳහා ජාතික නිති රිති නේවාසික ස්ථාන, සංචාරක මඟ පෙන්වන්නන්, කුලි රථ, ආරක්ෂාව පිළිබඳ බල පැවැත්වෙන කොන්දෙසි
- රාජ්‍ය ආයතන - සංචාරක අමාත්‍යංශය, පළාත් සංචාරක අමාත්‍යංශය, ආගමන විගමන දෙපාර්තමේන්තුව, වනජීවී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, සංස්කෘතික පරිසර අමාත්‍යංශය ආදිය.

(ලකුණු 06 යි)

(මුළු ලකුණු 16)

7. (i) 'මල්වරවීම' හඳුන්වන්න.

- මල්වර වීම යොවුන් වියේ ආරම්භයේදී සිදු වේ.
- වයස අවුරුදු 10-13 අතර දී ගැහැණු ළමුන්ද අවුරුදු 12-16 අතර දී පිරිමි ළමුන්ද මල්වර වීම සිදුවේ.
- ලිංගික පරිනතිය ඇති වේ.
- ද්විතියික ලිංගික ලක්ෂණ බාහිරව පෙන්නුම් කරයි

(ලකුණු 02 යි)

(ii) මානසික සමබරතාවයෙන් යුත් යෞවනයෙක් පිළිබිඹු කරන ලක්ෂණ හතරක් ලියන්න.

- මානසික කැළඹිලිවලින් තොරබව
- සන්සුන් බව
- මානසික ආබාධවලට ගොදුරු නොවේ
- සිත එකඟ කර ගනියි
- උගත් කරුණු සිතේ ධාරණය වේ
- ධාරණය වූ කරුණු නැවත සිහිපත් කිරීම පහසුය.
- විභාගවලට හොඳින් මුහුණ දේ
- ගැටලුවලට සාර්ථකව මුහුණදේ

(ලකුණු 04 යි)

(iii) යෞවනයා මුහුණ දෙන වෘත්තීමය ගැටලු පැහැදිලි කරන්න.

- උගත්කමට සරිලන රැකියා නොලැබීම.
- නිසි වැටුපක් නොලැබීම.
- වෘත්තිය පිළිගැනීම සම්බන්ධ ගැටලු
- වෘත්තිය පුහුණුව හා සම්බන්ධ ගැටලු
- රැකියා සඳහා අවශ්‍ය සුදුසුකම් පිළිබඳ ගැටලු
- රැකියා සම්බන්ධ කුසලතා පිළිබඳ ගැටලු
- නොගැලපෙන රැකියා ලැබීම.
- කැමති රැකියා අවස්ථා අවම වීම.
- නවීන තාක්ෂණය නිසා සමහර රැකියා සඳහා ඉල්ලුම අඩු වීම.
- විදේශ රැකිය සඳහා යොමු වීමේ ගැටලු

(ලකුණු 05 යි)

(iv) යොවුන් දරුවන්ගේ සංවර්ධනය කෙරෙහි සමවයස් කණ්ඩායමේ බලපෑම සාකච්ඡා කරන්න.

ධනාත්මක :-

- ගැටලු විසඳා ගැනීමට දායක වේ.
- තීරණ ගැනීමට සහය වේ.
- ක්‍රීඩා තරඟාවලියට අනාගත අවස්ථාව ලැබේ
- නව අදහස් ඉදිරිපත් වේ.
- ඉවසීම ප්‍රගුණ කර ගත හැකි වේ.
- අනෙක් අයට උපකාර කිරීමට සහාය වීමට අවස්ථාව ලබයි.
- අදහස්වලට ගරු කිරීමට පෙළඹේ
- අනුකරණයට අවස්ථාව ලබයි (යහපත්)
- පරාර්ථකාමී වේ. (Sharing)
- එකමුතුව ක්‍රියාකිරීමට දායක වීමට අවස්ථාව ලබයි
- සමාජ කටයුතුවලට දායක වීමට අවස්ථාව ලබයි
- පෞරුෂ වර්ධනයට දායක වේ.

සෘණාත්මක :-

- අනුකරණය අයහපත් ලෙස ක්‍රියා කළ හැකිය
- කණ්ඩායම් බලපෑම නිසා සමාජ විරෝධී ක්‍රියාවල යොමු වීම (මත් පැන්, දුම් වැටි, මත් ද්‍රව්‍ය)
- කල්ලි ගැසීම (දුරාචාරයට යොමු වීම)
- (Smart phone) භාවිතයට නිසා ඇබ්බැහි වීම

(ලකුණු 05 යි)

(මුළු ලකුණු 16 යි)

8. **පහත දැක්වෙන මාතෘකා අතුරෙන් හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.**

(i) නිර්මාණයක වටිනාකම කෙරෙහි බලපාන මූලිකාංග

ඕනෑම නිර්මාණයක වටිනාකමට හා සාර්ථකත්වය කෙරෙහි මූලිකාංග බලපායි. මූලිකාංග වනුයේ රේඛා, හැඩය, වර්ණය, වයනයයි.

රේඛා - තිරස් රේඛා, සිරස් රේඛා, අක්වක් රේඛා, විකර්ණාකාර රේඛා හා වක්‍ර රේඛා ලෙස විවිධ වන අතර ඒවායින් නොයෙකුත් අදහස් ජනිත කරයි.

හැඩය - එක තලයක් මත විවිධ රේඛා සම්මිශ්‍රණයෙන් සෑදෙන හැඩය ද්විමාන හැඩය වේ. අවකාශය තුළ විහිදී ඇති විවිධ රේඛා සම්මිශ්‍රණයෙන් බිහිවන හැඩය ත්‍රිමාණ හැඩය වේ.

වයනය - යම් කිසි නිර්මාණයක මතු පිට ස්පර්ශ කිරීමෙන් හෝ ස්පර්ශ නොකර දැකීමෙන් හෝ ඇතිවන හැඟීම වයනය වෙයි. පෘෂ්ඨයක ස්වභාවය මෘදු, සිනිඳු, ගොරෝසු, හා රළු වශයෙන් විවිධ වේ. ගොඩනැගිල්ලක වයනය වෙනස් කිරීමෙන් අලංකාරය වැඩි කර ගත හැකි වේ.

වර්ණය - වර්ණ නාමය, වර්ණ වටිනාකම හා වර්ණ තීව්‍රතාවය ලෙස වර්ණවල ගුණාංග 03කි. නිර්මාණාත්මක ක්‍රියාවන්හි දී වැඩි වශයෙන් චිත්‍ර කලා වර්ණ පද්ධතිය භාවිතා කරන අතර එහි ප්‍රාථමික වර්ණ, ද්විතීයික වර්ණ, අන්තර් මාධ්‍ය වර්ණ හා තෘතික වර්ණ ඇත. වර්ණ චක්‍රයට අයත් නොවන සුදු, අළු, කළු යන වර්ණ උදාසීන වර්ණ වේ.

(ලකුණු 04 යි)

(ii) ස්ථූලතාව පාලනය සඳහා වැදගත් වන ආහාර පුරුදු

- ක්ෂණික ආහාර පරිභෝජනය අඩු කිරීම, අධික මේදය හා සීනි ආහාර ගැනීම අඩු කිරීම.
- අක්‍රමවත් ලෙස ආහාර වේල් මඟ හැරීම සිදු නොකිරීම
- සැහැල්ලු ප්‍රධාන ආහාර වේල් සමඟ කුඩා ආහාර වේල් කිහිපයක් ගැනීම
- ශක්තිය අඩු, පෝෂණය වැඩි ප්‍රධාන ආහාර වේල් හා කෙටි ආහාර වේල් ලබා ගැනීම
- තන්තු බහුල ආහාර වැඩිපුර පරිභෝජනය කිරීම
- තිවුඩු සහිත ධාන්‍ය, මාෂබෝග, නැවුම් එළවලු හා පලතුරු වැඩි ප්‍රමාණයක් එක් කර ගැනීම

- කාබෝහයිඩ්‍රේට් අධික/ ශක්තිය අධික ආහාර අඩු කිරීම (පාන්, බේකරි නිෂ්පාදන, කේක්, මැකරෝනි, නූඩ්ල්ස් වැනි ධාන්‍ය නිෂ්පාදන, වියළි පළතුරු, අල වර්ග, සීනි, පැණි, හකුරු හා පැණි රස පුඩිං වර්ග හා ලොසින්ජර් වර්ග)
    - මේද අධික ආහාර උදා :- බටර්, චීස්, චොකලට්, අයිස්ක්‍රීම්, මේදය සහිත මස්/මාළු, බදින ලද ආහාර, චිප්ස් වර්ග, පේස්ට්‍රි වර්ග, තෙල් වර්ග, තෙල් සහිත වියළි ඇට වර්ග අඩු කිරීම
    - පාන වර්ග උදා :- සීනි අධිකව යෙදූ පාන, කාබනීකෘත බීම, මත් පැන්, චොකලට් මිශ්‍ර පාන අඩු කිරීම
    - තන්තු සහිත ආහාර උදා :- එළවළු හෝ පලතුරු නිවුඩ්ඩ සහිත ධාන්‍ය, පරලු පාන් ආටා පිටි පලාවර්ග හා මාෂබෝග, සම ඉවත් කළ කුකුළු මස්, තෙල් රහිත මස් හා කුඩා මාළු මේදය රහිත කිරි හා කිරි නිෂ්පාදන සුදුසු වේ.

(ලකුණු 04 යි)

(iii) ගෘහපිළි නිර්මාණය කිරීමේ දී භාවිත වන මැහුම් ක්‍රම

භාවිතවන මැහුම් ක්‍රම,

- මූලික මැහුම් ක්‍රම
- ශිල්පීය මැහුම් ක්‍රම
- විසිතුරු මැහුම් ක්‍රම

මූලික මැහුම් ක්‍රම,
උදා :- නූල් දුව වීම (නූල් ඇදීම), සිහින් නූල් දුව වීම, වාටි මැස්ම, පිස්මේන්තු මැස්ම
ශිල්පිය මැහුම් ක්‍රම,
උදා :- බඳන යෙදීම, මුට්ටුවර්ග, රේන්ද ඇල්ලීම, රැළිවර්ග, පොලොව් වර්ග, ආර, ඔපනැලි, අණ්ඩ දැමීම, එළලීම
විසිතුරු මැහුම් ක්‍රම,
උදා :- දම්වැල් මැස්ම, නැටි මැස්ම, පිරවිලි මැස්ම (සැටින් මැස්ම), ලෙසිඩේසි මැස්ම, බ්ලැන්කට් මැස්ම, ප්‍රංශ ගැට, බුලියන් මැස්ම සහ බ්‍රසීලියන් එම්බ්‍රොයිඩර් මැහුම් ක්‍රමද භාවිතා කරයි.

මේ එක් එක් මැහුම් ක්‍රමය යටතේ උදාහරණ එක බැගින් වත් ලිවිය යුතු වේ.

(ලකුණු 04 යි)

(iv) සංචාරකයින් සඳහා ඉදිරිපත් කරන නිවාඩු කාල පැකේජ

සංචාරක මෙහෙයවන්නන් ඉදිරිපත් කරන නිවාඩු කාල පැකේජ පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත ය.

- ප්‍රවාහන පහසුකම් (දුම්රිය, මහාමාර්ග, ගුවන්, නාවික)
- නේවාසික පහසුකම් (හෝටල්, නිකේතන, සංචාරක බංගලා)
- සංචාරක සේවා ලෙස ගුවන් තොටුපලට රැගෙන යාම ඒම (ariport transfers)
- විවිධ ස්ථාන නැරඹීම සඳහා යාම, ගවේෂණය, විනෝද චාරිකා (excursions) ආදිය

(ලකුණු 04 යි)

(v) යොවුන් අවධිය තුළ සිදුවන සදාචාර වර්ධනය

- සමාජ අපේක්ෂා කරන ගුණධර්ම තිබීම
- සමාජය අනුගමනය කරන, පිළිපදින සම්මත නිතීරීති
- සිරිත් විරිත්, සම්ප්‍රදායයන් වර්ධනය වේ.
- සදාචාර වර්ධනය, බුද්ධි වර්ධනය සම්බන්ධ වේ.
- අන්තර් සම්බන්ධතාවයෙන් කටයුතු කරන අතර, අන්‍යෝන්‍ය ගරුත්වය මත ක්‍රියාකරයි. මේ සඳහා සමාජමය අත්දැකීම් බලපායි.
- නිදහස් චින්තනයට හුරු වේ.
- සමාජ නිති රිති, ගිවිසුම්, සම්මුති, සමාජයට, හිතකර පරිදි වෙනස් කිරීමට කැමති වේ.
- සදාචාර වර්ධනය නිසා සමබර පෞරුෂයක් ඇති වේ.

(ලකුණු 04 යි)

(මුළු ලකුණු 04 x 4 =16 යි)